# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.04 පැය 2250 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1992 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## 2025 පොලිස්පති අභියෝගතා කුසලාන ටයිකොන්ඩෝ තරඟාවලියේ අවසන් තරඟය, කුසලාන හා සහතික පත්‍ර ප්‍රධානය.

2025 පොලිස්පති අභියෝගතා කුසලාන ටයිකොන්ඩෝ තරඟාවලියේ අවසන් තරඟය හා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට සහතිකපත්‍ර හා කුසලාන ප්‍රදානය 2025.11.04 වන අද දින ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවණාගාරයේදී කොරියානු තානාපති මියෝන් ලී මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

මෙහිදී, පොලිස් ටයිකොන්ඩෝ තරඟාවලිය නියෝජනය කරන ලද පොලිස් විශේෂ කාර්ය බලකාය හා දිවයිනේ සියලුම පළාත් නියෝජනය වන පරිදි තරඟ වදින ලද පොලිස් ටයිකොන්ඩෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් ජයග්‍රහණය කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා කණ්ඩායම් වලට සහතිකපත්‍ර හා ශූරතා කුසලාන ප්‍රදානය කෙරිණි.

ඒ අනුව,

- ශ්‍රී ලංකා පොලිසියට හා පොලිස් විශේෂ කාර්ය බලකායට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයින් අතර පැවති තරඟාවලියේ සමස්ත ශූරතාවය ලකුණු 38 ක් ලබා ගත් පොලිස් විශේෂ කාර්ය බලකා ටයිකොන්ඩෝ කණ්ඩායම විසින් හිමි කර ගන්නා ලදී. තවද ආධුනික ක්‍රීඩකයින්ගේ සමස්ථ ශූරතාවය ලකුණු 68ක් ලබා ගත් බස්නාහිර පළාත පොලිස් ටයිකොන්ඩෝ නිලධාරීන් කණ්ඩායම විසින් හිමි කර ගන්නා ලදී.

- ජ්‍යෙෂ්ඨ තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස පොලිස් කොස්තාපල් 101324 ආර්.එම්.කේ.එම්. රත්නායක නිලධාරියාද, ආධුනික නිලධාරීන්ගේ තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස පොලිස් කොස්තාපල් 60105 ඩබ්ලිව්.එම්.එම්.එල්. විජේසිංහ ක්‍රීඩකයාද දක්ෂතම ආධුනික ක්‍රීඩිකාව ලෙස කාන්තා පොලිස් කොස්තාපල් 10398 එන්.ඩී.එස්.පී. වීරවර්ධන විසින්ද හිමි කර ගන්නා ලදී.

ටයිකොන්ඩෝ ක්‍රීඩාව ශ්‍රී ලංකා පොලිසිය තුල තව දුරටත් ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති තුමිය විසින් පොලිස්පතිතුමා වෙත ටයිකොන්ඩෝ ක්‍රීඩා උපකරණ ප්‍රදානය කරන ලද අතර පොලිස්පතිතු මා විසින් කොරියානු ජනරජය හා ශ්‍රී

ලංකාව අතර පවතින රාජ්‍ය තාන්ත්‍රික සබඳතාව සනිටුහන් කරමින් කොරියානු තානාපති තුමිය වෙතද සිහිවටන තිළිණයක් ප්‍රදානය කෙරිණි.

මෙම අවස්ථාව, රත්නපුර ටයිකොන්ඩෝ ක්‍රීඩා සමාජයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රදර්ශණාත්මක ටයිකොන්ඩෝ සංදර්ශණයකින්ද, පොලිස් සංස්කෘතික කොට්ඨාස නර්තන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද නර්තනාංගයන්ගෙන්ද වර්ණවත් විය.

මෙම අවස්ථාවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන සංජීව ධර්මරත්න, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත, පොලිස් ටයිකොන්ඩෝ සංගමයේ සභාපති නියෝජ්‍ය පොලිස්පති සිසිර කුමාර, පොලිස් ටයිකොන්ඩෝ සංගමයේ ලේකම් කාන්තා සහකාර පොලිස් අධිකාරි නිරෝෂා කුමාරි, කොරියානු තානාපති කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, ටයිකොන්ඩෝ ජාතික පුහුණුකරු මාස්ටර් කී සුලී මහතා ඇතුළු මහත්ම මහත්මීන් හා උසස් පොලිස් නිලධාරීන් පිරිසක්ද සහභාගි විය.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**







KWON
KWON
CU
2025
CRD
Photo Bureau


ENGE
HAM SHIP
CRD
Photo Bureau


2025
CRD
Photo Bureau



ENGE
AMPIONS
2025
CRD
Photo Bureau


CRD
Photo Bureau


CRD
Photo Bureau


CRD
Photo Bureau


CRD
Photo Bureau





පොලිස් මාධ්‍ය කොට්ඨාසය.